  

# ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මත
# අයවැයකරණය

කාන්තා දේශපාලන පීඨයේ ව්‍යාපෘතියකි.

අනුග්‍රහය:

යුරෝපා සංගමය

IMADR

# ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මත අයවැයකරණය

කාන්තා දේශපාලන පීඨයේ ව්‍යාපෘතියකි.

අනුග්‍රහය:

**යුරෝපා සංගමය**

IMADR

# පෙරවදන

පුරවැසියන්ගේ ආර්ථික හා සාමාජීය අවශ්‍යතාවයන් මුදුන් පත් කරලීමට යොමු වන ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවන් සඳහා මුදල් වෙන් වන්නේ අයවැය මගිනි. මේ නිසා අයවැයකරණය සම්බන්ධයෙන් අප මීට වඩා උනන්දුවක් දැක්විය යුතුය. අයවැය ලේඛනය දේශපාලන අවියක් වශයෙන් ද, ආර්ථික ක්‍රියාදාමයක් වශයෙන් ද, මානව අයිතිවාසිකම් සඳහා වන නිර්ණායකයක් වශයෙන් ද යොදා ගත හැකිය. සාමාන්‍යයෙන් ගත් කල අයවැය ලේඛණයෙන් ස්ත්‍රී-පුරුෂ අසමානතාවයක කතන්දරයක් අපි නොදකිමු. මන්ද වැය ශීර්ෂයෙන් කියැවෙන බදු පැනවීම හා බදු ආදායම ලබා ගැනීම යන ක්‍රියාදාමයන් හුදෙක්ම ආර්ථිකමය වූ ක්‍රියාවලියක් වන්නේ ය. එහෙත් මුදල් වැය කිරීම හා ඉපයීම යන ආර්ථික ක්‍රියාදාමය තුළ අසමානතාවයන් ඇති කිරීම, පවත්වාගෙන යාම හෝ නැති කිරීමට හැකියාවක් ඇති බව තේරුම් ගන්නේ සමාජයේ අතලොස්සක් පමණි. විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා සංවර්ධනය යන කාර්යයෙහි ලා අයවැය ඉතාමත් වැදගත් වූ ප්‍රතිපත්තිමය ලේඛනයකි. අයවැයකරණය හරහා ස්ත්‍රීන්ගේ ජීවිත කෙරේ ඇති කරවන ඵල විපාක ගැන සොයා බැලීමට අප යොමු වුණේ 2000 නිව්යෝර්ක් නගරයේ පැවති බීජිං කාන්තා සමුළුවේ පසු විපරම් සඳහා කැඳවූ සම්මේලනයට පසුවයි. මෙම සම්මේලනය එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් කැඳවන ලදි. මෙම සමුළුවේදී බොහෝ රටවල් පවසා සිටියේ මුදල් නොමැති කම නිසාවෙන් බීජිං ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවය.

කාන්තා අභිවෘද්ධිය සඳහා වූ (1975) බීජිං සමුළුවේ වැඩ සැලසුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් නොමැති වූ බව රාජ්‍ය පාලකයන් පවසන ලදි. ඒ තත්ත්වය සැලකිල්ලට ගත්

එක්සත් ජාතීන්ගේ කාන්තා සංවර්ධන අරමුදල තෝරා ගත් රටවල් කිහිපයක අයවැය විමර්ශනය කරමින් මෙම තත්ත්වයට විසඳුම් සෙවීමට අවතීර්ණ විය. ඒ අනුව අයවැයකරණයේදී තිබිය යුතු ස්ත්‍රී සංවේදීතාව කෙසේ ගොඩනගා ගත යුතුද යන්න ගැන වැඩමුළු කිහිපයක් ජාත්‍යන්තර හා ජාතික වශයෙන් පවත්වා රැස්කර ගත් තොරතුරු හා දැනුම් සම්භාරය මත මෙම විශ්ලේෂණය ගොඩනගා ඇත.

මෙම අත්පොත මෙම සංවාදය ශ්‍රී ලංකාව තුළ දියත් කිරීමටත්, ක්‍රියාකාරී වැඩ සැලසුම් නිර්මාණය කිරීමටත් උපකාරී වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙම අත්පොත සැකසෙන්නේ කාන්තා දේශපාලන පීඨයේ පුහුණු වැඩසටහන ඉදිරියට ගෙන යාම ඔබට උපකාරකයක් වශයෙනි. මෙම ප්‍රකාශනය මුද්‍රණය කිරීමට අපට ආධාර සැපයූ යුරෝපා සංගමයට අප ස්තුතිවන්ත වන්නේ මෙම පුරෝගාමී කර්තව්‍යය හඳුනාගෙන එයට මැදිහත් වීමට මෙසේ අප දිරි ගැන්වූ බැවිනි.

මෙම කර්තව්‍යය සාර්ථක වන්නේ දේශපාලනයේ නිරත පිරිමින් හා ගැහැණුන්ගේ මැදිහත්වීම මත පමණි. පාර්ලිමේන්තුව, පළාත් සභා, අනිකුත් පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් හා සභිකයන් අප සමග එක්වී ස්ත්‍රී සංවේදී අයවැයකරණ ක්‍රියාවලිය පෙරට ගැනීමට අතහිත දෙනු ඇතැයි අපි ප්‍රාර්ථනා කරමු.

නීතීඥ නිමල්කා ප්‍රනාන්දු
අධ්‍යක්ෂ
කාන්තා දේශපාලන පීඨය
30 සැප්තැම්බර් 2011

''රටක ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කිරීමේ කාර්යය උදෙසා වගකීම ඇති අය විසින් ඒ වෙනුවෙන් අවශ්‍ය වන ප්‍රතිපත්ති සකස් කිරීමත්, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමත් සිදු කළ යුතුය. මෙවැනි ප්‍රතිපත්තිමය විපර්යාසයකින් තොරව කිසිදු රටක ස්ත්‍රී අයිතිවාසිකම් සාක්ෂාත් කිරීම හා ස්ත්‍රීන්ගේ අභිවෘද්ධිය ළඟා කර ගත නොහැකිය.''

- යුනිෆෝම් ආයතනය

# කාන්තා සංවේදී අයවැයකරණයේ ඉතිහාසය දෙස හැරී බලමු...

කාන්තා දෘෂ්ටිකෝණයකින් 2003 ජාතික අයවැය ඇස්තමේන්තුව විශ්ලේෂණය කිරීම පොදු රාජ්‍ය මණ්ඩලය හා යුනිෆෙම් ආයතනය මගින් සිදු කරන ලදි. මෙම ස්ත්‍රී දෘෂ්ටිකෝණයකින් ජාතික අයවැය විශ්ලේෂණය කිරීමේ අධ්‍යයනය සම්බන්ධීකරණය කරනු ලැබුවේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසිනි.

මෙමගින් පහත සඳහන් අමාත්‍යාංශ වල වැය ශීර්ෂ අධ්‍යයනය කරන ලදි.

- සෞඛ්‍ය
- අධ්‍යාපන
- රාජ්‍ය අංශයේ රැකියා
- කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය
- කර්මාන්ත හා සමාජ සේවා

## වියදම්

- අයවැයෙන් ජනතාවගේ පොදු සහන සැපයීමේදී හෝ සංවර්ධය සඳහා සම්පත් වෙන් කිරීමේදී අසමානතාවයක් දක්නට නොලැබිණි.

- අධ්‍යාපන අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදමෙන් 48% ක් කාන්තා ප්‍රතිලාභ සඳහා දායක වී ඇත.

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ 56%ක්ද, සමාජ සේවා අංශයෙන් 57% ක් ද, කාන්තාවන් සඳහා ප්‍රතිලාභ ලබා දීමට දායක වී ඇත.

- කෘෂිකර්මාන්තය හා කර්මාන්ත අංශ වලදී රාජ්‍ය වැඩසටහන් වලදී කාන්තාවන් සඳහා ප්‍රතිලාභ ලබා දීම අවම මට්ටමක පවතී.
- ආණ්ඩුව විසින් දියත් කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘති තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පවතී. මෙම වැඩසටහන් පොදු ජනතා ව්‍යාපෘති පදනම මත ක්‍රියාත්මක කිරිම තුළ කාන්තා සහභාගීත්වය තහවුරු වේ යැයි උපකල්පනය කළ ද එසේ සිදු වී නැත.

- අයවැය ප්‍රතිපත්ති තුළ කාන්තා සහභාගීත්වය වර්ධනය කර ගැනීම සඳහා නිශ්චිත දර්ශනයක් නොතිබිණි.

- වනිතා කටයුතු අමාත්‍යාංශයට වෙන්ව තිබුණේ 0.02% ප්‍රතිපාදනයක් පමණි.

## වැඩසටහන්

- 1999 සිට 2003 කාල පරාසය තුල අයවැය වාර්තා දීර්ඝ විශ්ලේෂණයකට භාජනය කිරීමේදී පෙනී යන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අමාත්‍යාංශ 58 අතුරින් කාන්තාවන් සඳහාම වන වැඩසටහන් දියත් කර ඇත්තේ අමාත්‍යාංශ 7ක් පමණක් බවයි.

- කාන්තා කටයුතු අමාත්‍යාංශය හැරුණු විට කාන්තා වැඩසටහන් සඳහා ඍජුව දායක වී ඇති අමාත්‍යාංශ නම් සමාජ සේවා අමාත්‍යාංශය, සමෘද්ධි අමාත්‍යාංශය, කම්කරු හා රැකියා අමාත්‍යාංශය, තෘතීය අධ්‍යාපන සහ පුහුණු අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය හා ධීවර අමාත්‍යාංශයයි.

## 2003 අධ්‍යයනයේ සොයා ගැනීම්

- ඉහත සඳහන් අමාත්‍යාංශ 7 සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සමස්ත අයවැයේ මුළු වියදමෙන් 7.68% ක ප්‍රමාණයක් විය.

- එය පොලී රහිත රාජ්‍ය වැයෙන් 9.35% ක් විය.

- මෙම අමාත්‍යාංශ 7 අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා සමෘද්ධි අමාත්‍යාංශය අනෙක් ඒවාට සාපේක්ෂව වැඩි මුදල් ප්‍රමාණයක් වැය කොට ඇත.

- ආණ්ඩුවේ සමස්ත වැය ශීර්ෂයන් අතුරින් කාන්තා කටයුතු අමාත්‍යාංශය සඳහා වෙන් කොට තිබුනේ 0.02% ක් තරම් අවම ප්‍රමාණයකි.

- අන් සියළුම අමාත්‍යාංශ වල කාන්තාවන් ඉලක්ක කොට පවත්වන වැඩසටහන් 39ක් වූ අතර වනිතා කටයුතු අමාත්‍යාංශය හැර අන් සෑම අමාත්‍යාංශයකම කාන්තාවන් ඉලක්ක කර පවත්වන ලද වැඩසටහන් සඳහා වෙන් කොට තිබුනේ ඉතා අවම මුදල් ප්‍රමාණයකි.

- කාන්තා කටයුතු අමාත්‍යාංශය කාන්තාවන් ඉලක්ක කරගෙන පවත්වන ලද වැඩසටහන් සඳහා 40.52% ක් වියදම් කර තිබුණි. එහෙත් මෙම අමාත්‍යාංශයට මුළු රාජ්‍ය වැයෙන් වෙන් කර තිබුනේ 0.02% ක් පමණි.

- එම නිසා කාන්තා කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් වැඩි ප්‍රමාණයක් කාන්තා වැඩසටහන් ඉලක්ක කොට වෙන් කරන ලද බව පෙනී ගියද, එය ප්‍රමාණවත් යැයි පිළිගත නොහැක.

## එබැවින් මෙවර අයවැයෙන් කාන්තා අමාත්‍යාංශ වැය 0.02% ක මට්ටමක රැඳී පැවතිය හැකිය?

ශ්‍රී ලංකාවේ 52% ක් වන කාන්තාවන් විසින් තම ඡන්දයෙන් තෝරා පත් කරන ලද මහජන නියෝජිතයන් වන ඔබගෙන් අප අසනු ලබන පැනය එයයි.

## එබැවින් මෙවර අයවැයෙන් කාන්තා අමාත්‍යාංශ වැය 0.02% ක මට්ටමක රැඳී පැවතිය හැකිය?

ශ්‍රී ලංකාවේ 52% ක් වන කාන්තාවන් විසින් තම ඡන්දයෙන් තෝරා පත් කරන ලද මහජන නියෝජිතයන් වන ඔබගෙන් අප අසනු ලබන පැනය එයයි.

# ශ්‍රී ලංකාවට කාන්තා සංවේදී අයවැයක්....

## තොරතුරු

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52%ක් ස්ත්‍රීන්ය. ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සංවිධානයට ලබා දී ඇති වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී මූලික පවුල් සංඛ්‍යාව 23% කි. යුද්ධයෙන් අවතැන්වූවන් මෙම සංඛ්‍යා ලේඛනයට අතුලත් නැත. නිදහස් වෙළඳ කලාපයේ ශ්‍රමයෙන් 90% ක් තරුණියන්ය. මැදපෙරදිග සේවයේ අඩු නිපුණතා ක්ෂේත්‍රයට අයත් 75% ක් කාන්තාවන් ය. ශ්‍රී ලංකාවේ අන්ත දුගීන් අතුරින් දූගීම පිරිස කාන්තාවන් බවද තහවුරු වී ඇත. එසේ නම් අයවැයෙන් කාන්තාවන්ට සෙත සැලසෙන්නේ කෙසේද?

## කාන්තා කටයුතු අමාත්‍යාංශය සඳහා කොතරම් මුදලක් වෙන් කර තිබේ ද?

- මෙම වෙන්කල මුදලින් කොතරම් ප්‍රතිපාදනයක් කාන්තාවන්ගේ සමාජ තත්ත්වය හා සුබසාධනය නැංවීම හා සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි සමාන අයිතිවාසිකම් ලබා දීම සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කර තිබේ ද?
- තෘතියීක අධ්‍යාපන ආයතන තුළ මහාචාර්යවරියන් ඉතාම සුළු සංඛ්‍යාවක් පමණක් සිටීම තුලින් ප්‍රත්‍යක්ෂ වනුයේ අධ්‍යාපන අයවැය කාන්තා සංවේදීතාවයෙන් තොර බව නොවේ ද?

- වතුකරයේ මන්දපෝෂණය ඉහළ මට්ටමක පවතී. වතුකරයේ මන්දපෝෂණය තුරන් කිරීම සඳහා කෙතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කොට තිබේ ද?

- අවතැන් වූ කාන්තාවන්ගේ සුබසාධනය සඳහා කොතරම් මුදලක් වෙන් කොට තිබේ ද? ඒ කුමන අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ ද?

- ව්‍යවස්ථාවේ නියමිති පරිදි සමාන අයිතිවාසිකම් භුක්ති විඳීම සහතික කිරීම සඳහා අධ්‍යාපන හා සමාජ දැනුවත්කම් වර්ධනය කරන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා රජය පහසුකම් සලසන්නේ කෙසේ ද? මෙවැනි වැඩසටහන් සඳහා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ඇස්තමේන්තු තුල කොතරම් මුදලක් වෙන් කොට තිබේ ද?

- දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීමේ වැඩසටහන් දියත් කිරීම සඳහා කාන්තා කටයුතු අමාත්‍යාංශය කොතරම් මුදලක් වැය කිරීමට බලාපොරොත්තු වන්නේ ද?

- එළඹෙන පළාත් පාලන මැතිවරණය හා ඉදිරි සෑම මැතිවරණයකදීම සෑම දේශපාලන පක්ෂයක් විසින්ම 30% ක් කාන්තා නාම යෝජනා අයිතියක් ලබා දීමට ගෙන ඇති පියවර මොනවා ද?

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන්ට සහන සැලසීම සඳහා කොරතම් මුදලක් ඇස්තමේන්තු කර තිබේ ද? එමෙන්ම 2005 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නැංවීම සඳහා ගන්නා ඉදිරි පියවර මොනවාද?

- කාන්තාවන් කොපමණ සංඛ්‍යාවක් සමෘද්ධි වැඩසටහනින් ඍජු ප්‍රතිලාභ හෝ ජීවනෝපාය අවස්ථා ලබා ඇත්ද? එබඳු ප්‍රගතියක් ලබා ගැනීමෙන් පසු සමෘද්ධි වැඩසටහනෙන් ඉවත් වූ කාන්තාවන් සංඛ්‍යාව කොපමණද?
- ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා දර්ශකය කුමක් ද?

## ශ්‍රී ලංකා රජය විසින් කාන්තාවන්ට දුන් ප්‍රතිඥා මෙසේ සිහිපත් කරමු.

- කාන්තාවන්ට සිදු වන අසාධාරණය පිටු දැකීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට 1981 දී ශ්‍රී ලංකාව සිය අත්සන තබා ඇත.
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් වන ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ 1325 සංශෝධනය පිළිගෙන ඇත. එමෙන්ම 1995 බෙයිජිංහි සම්මත වූ Beijing Platform for Action සම්මුතියට අනුව කාන්තාවන් බලායනය කිරීම සඳහා එකඟ වී ඇත.



## ශ්‍රී ලංකාවට කාන්තා සංවේදී අයවැයක් අවශ්‍ය වන්නේ ඇයි?

- කාන්තාවන් මුහුණ දෙන ගැටළු සඳහා දියත් කරන වැඩසටහන් වලට අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව අප විසින් ප්‍රශ්න රාශියක් මතු කර ඇත්තෙමු. සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශ වැනි ඇතැම් අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරන ඇතැම් වැඩසටහන් ඍජුව කාන්තාවන් ඉලක්ක කොට නොපැවැත් වූවද කාන්තාවන්ට ඉන් ප්‍රතිලාභ හිමි වන බව අපට පෙනේ. අධ්‍යාපන, සෞඛ්‍ය හෝ ආරක්ෂක අමාත්‍යාංශය මේ ලැයිස්තුවට අයත් වනු ඇත.

- ශ්‍රී ලංකාවේ යුද්ධය හා සුනාමිය හේතුවෙන් අපහසුතාවයන්ට මුහුණ දීමට කාන්තාවන්ට සිදු විය. එසේම දිළින්දන් අතර දිළින්දන් වන්නේ ද කාන්තාවන්ය. වර්ධනය වන ආර්ථික පීඩනයන් හමුවේ ඔවුන්ට දැඩි අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වේ.

- සමාජයේ සියළු ක්ෂේත්‍රයන්හි තීරණ ගැනීමේදී බොහෝ විට කාන්තා මතයට ඉඩක් නොලැබේ. කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා වෙනත් හිංසන ඉහළ යෑමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර, බාහිර පරිසරය හා පොලීසිය ඇතුළු වෙනත් අධිකාරයන් මගින් ලැබෙන සහයෝගීතාවය අඩු වීම නිසා පවත්නා නීති රීති මගින් සහනයක් ලබා ගැනීමද අපහසු වී ඇත. ව්‍යවස්ථාවෙන් ව්‍යවස්ථාපිත වුවද සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ හැකියාව කාන්තාවන් වෙතින් ගිලිහී ඇත්තේ කාන්තාවන් කෙරේ සංවේදී නොවන අපගේ සමාජ සංස්කෘතික රටාව නිසාය.

- ආණ්ඩුව විසින් දෙනු ලබන පොරොන්දු හා ප්‍රතිපත්ති ඉදිරියේ නිශ්චිත හා අපේක්ෂිත සංඛ්‍යා ලේඛන තිබීම අවශ්‍යය. එසේ නැතහොත් එය හුදු කඩදාසියට පමණක් සීමා වූ වචන කිහිපයක් වනු ඇත.

## කාන්තා සංවේදී අයවැයක් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

මෙමගින් කාන්තාවන් සඳහා වෙනමම අයවැයක් යන්න අදහස් නොවේ. ස්ත්‍රී දෘෂ්ටිකෝණයකින් අයවැය විශ්ලේෂණය කිරීම මෙමගින් අදහස් වේ.

මෙමඟින් අයවැයකරණ ක්‍රියාවලිය හරහා අපගේ පැවැත්ම සහ අයිතිවාසිකම් කෙරේ ඇති වන්නා වූ බලපෑම අධ්‍යයනය කරන අතර ස්ත්‍රීන්ගේ සුබසාධනය සඳහා වන වගකීම අයවැය වගකීමක් ලෙසට පරිවර්තනය කෙරේ.

2011 අයවැය මගින් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට වෙන් කර ඇත්තේ රුපියල් මිලියන 987 ක මුදලක් පමණි. නමුත් ආරක්ෂක අමාත්‍යාංශ වැය සඳහා රුපියල් බිලියන 215 ක මුදලක් වෙන් කර ඇත. **ආරක්ෂක අමාත්‍යාංශයේ මෙම වැය කිරීම් තුළ කාන්තා අයිතිවාසිකම්/සමානාත්මතාවය/මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා වැය කරන මුදල හා ව්‍යාපෘති මොනවා ද?** ස්ත්‍රී සංවේදී අයවැයකරණයේ අභියෝගය වන්නේ ස්ත්‍රී අභිවෘද්ධිය සඳහා වෙන් කල මුදල් හා ව්‍යාපෘති හඳුනා ගැනීමයි.



# පුහුණුකරුවන්ට මාර්ගෝපදේශකය

## සාකච්ඡා සටහන 1

මුලින්ම අපගේ අවධානය යොමු විය යුත්තේ පහත සඳහන් ප්‍රශ්න සාකච්ඡා කිරීමට ය.

**අයවැයකරණය යනු කුමක් ද?**

- අයවැය ලේඛනය සකස් කිරීම යනු ආර්ථික ක්‍රියාවලියකි.
- මෙම ක්‍රියාවලිය මුදල් ඉපයීම හා වියදම් කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති සකස් කිරීම හා බැඳී ඇත.

### සටහන

# සටහන

## සටහන

## සාකච්ඡා සටහන 2

### අයවැය විග්‍රහ කිරීමේදී මූලිකවම ඇසිය යුතු ප්‍රශ්න?

**මුදල් උපයා ගන්නේ කෙසේ ද? (Income)**

(අ) ආණ්ඩුවක්/පළාත් පාලන ආයතනයක් මුදල් උපයා ගන්නේ කෙසේ ද?

උදා.: විවිධ බදු පැනවීම මගින් (ආදායම් බදු, නිෂ්පාදන බදු, භාණ්ඩ හා සේවා බදු, ආනයන බදු, සුරා බදු, වැට් බදු, ආරක්ෂක බද්ධ)

**එම මුදල් වැය කරන්නේ කෙසේ ද? (Expense)**

(අ) රජයක මුදල් වියදම් වෙන් වන්නේ කුමන කාරණා වෙනුවෙන් ද?

උදා.: අමාත්‍යාංශ වැය ශීර්ෂය සඳහා වේතන, විවිධ වැඩසටහන්, ව්‍යාපෘති

(ආ) ජනතාවට ලබා දෙන විවිධ සුබසාධන හා සහනාධාර මොනවා ද?

(සටහන: සියලුම පළාත් පාලන ආයතන ආශ්‍රිතව මෙවැනිම ප්‍රශ්න මතු කරන්න.)

# සටහන

## සටහන

## සාකච්ඡා සටහන 3

### අයවැය ක්‍රියාවලිය

**අයවැය යනු දේශපාලන උපාංගයකි. (දේශපාලන ආයුධයකි.)**

පහත සඳහන් කරුණු උපයෝගී කර ගනිමින් විවිධ ගැටලු සාකච්ඡා කළ හැක. මන්ද, අයවැය ලේඛනය දේශපාලන ආයුධයක් බවට පත් වී ඇති අන්දම තේරුම් ගැනීමට මෙම සාකච්ඡාව උපකාරී වනු ඇත.

- ඡන්දදායකයන් සතුටු කිරීම.
- ඡන්ද පදනම ආරක්ෂා කර ගැනීම.
- ව්‍යාපාරික ප්‍රජාව සතුටු කිරීම.

මහජනයා හා මහජන අවශ්‍යතා සැලකිල්ලට ගන්නේද යන්න අද විශාල ප්‍රශ්නයක් බවට පත්ව ඇත.

### සටහන

## සටහන

## සටහන

## සාකච්ඡා සටහන 4

### ස්ත්‍රී සංවේදී අයවැයෙහි අරමුණු

1) ආණ්ඩුවේ/පළාත් පාලන ආයතනයේ ප්‍රතිපත්ති ප්‍රකාශන වල මුදල් වෙන් කිරීම හා අයවැය සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ අසමානතාවයන් නැති කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීම.

2) ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කරවීමත්, ඒ හරහා සමාජයේ ජීවත් වන පුද්ගලයන් කෙරේ ඇති වන බලපෑම් අතර ඇති සබඳතාවය තේරුම් ගනිමින් අයවැයකරණයේදී එම කාරණා අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.

3) සමාජයේ සියලුම ප්‍රතිලාභීන් අයවැයකරණයේ පංගුකරුවන් කරවීම.

4) රටේ සම්පත්, මුදල් ඵලදායී ලෙස යෙදවීම සඳහා වන මෙවලම සකස් කිරීම.

5) සහභාගීත්ව ක්‍රියාවලියක් මගින් අයවැය සකස් කිරීම හරහා ජනතාවගේ අයිතිවාසිකම් සහ සුබසිද්ධිය සහතික කිරීමට අනුබලයක් සැපයීම.

# සටහන

# සටහන

## සාකච්ඡා සටහන 5

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් නොවී සමානාත්මතාවය ප්‍රමුඛ කර ගනිමින් සකස් කරන අයවැය ලේඛනය/අයවැයකරණය යනු කුමක් ද?**

1) මෙම ක්‍රියාදාමය කාන්තාවන්ට පමණක් සුවිශේෂී වූ අයවැය සැළසුම් කිරීමක් නොවන්නේ ය.

2) මෙහිදී සිදු වන්නේ අයවැය ලේඛනය ස්ත්‍රී දෘෂ්ටි කෝණයෙන් විග්‍රහ කිරීමය. එසේම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ද ඒ අයුරින්ම විග්‍රහයකට ලක් කෙරේ.

3) අයවැය මගින් පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ අභිවෘද්ධිය තකා කොපමණ මුදලක් වෙන් කර ඇත්දැයි යන්න සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කිරීමයි.

   උදා.: අයවැයක් සකස් කිරීමේදී පිරිමි ළමුන්ට හා පිරිමි අයට සාපේක්ෂව ගැහැණු දරුවන්ට හා කාන්තාවන්ට කොතරම් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද යන්න සොයා බලමු.

**සටහන**

# සටහන

## සටහන

## සාකච්ඡා සටහන 6

**ස්ත්‍රී සංවේදී දෘෂ්ටි කෝණයකින් අයවැය විමර්ශනය තවදුරටත් මෙසේ සාකච්ඡාවට ලක් කල හැක.**

1) ස්ත්‍රී සංවේදී ප්‍රතිපත්ති ඇගයුම (අයවැය හා මෙම ප්‍රතිපත්ති අතර ඇති සබඳතාව සොයා බැලීම)

උදා.: යම් විෂයයක් සම්බන්ධයෙන් කාන්තාවන් හා ගැහැණු දරුවන්ට සාපේක්ෂව පිරිමින් හා පිරිමි දරුවන් වෙනුවෙන් ගෙන ඇති පියවර සොයා බැලීම. මෙහිදී වයස, ජාතිය, සමාජ තත්ත්වය හා තරාතිරම අනුව දත්තයන් සකස් විය යුතුය.

2) මහජන මුදලින් ජනතා/කාන්තා අවශ්‍යතා ඉටු වන්නේ දැයි සොබා බැලීම.

3) ප්‍රාදේශීය සභාවක මුදල් වෙන් කිරීමේදී ප්‍රමුඛතාවයන් හඳුනා ගන්නේ කෙසේ ද?

**සටහන**

# සටහන

# සටහන

## සාකච්ඡා සටහන 7

..............................................................

..............................................................

මේ සඳහා පහත සඳහන් ක්‍රමවේද උපකාරී වනු ඇත.

- මහජන මත විමසීම
- ආකල්ප සමීක්ෂණය
- විශේෂ කණ්ඩායම් සාකච්ඡා
- රංගන
- සම්මුඛ සාකච්ඡා

උදා.: ඉන්දියාවේ පංචායත් රාජ්හි (ග්‍රාම පළාත් පාලන ආයතනය) අයවැය සැකසීමේදී ප්‍රමඛතාවය තීන්දු වුණු ආකාරය විමසා බැලීම.

| | |
|---|---|
| ගැහැණු පිරිස 3 | - ජල අවශ්‍යතාවය |
| පිරිමි පිරිස 3 | - ප්‍රජා ශාලාව |
| තීන්දුව | - ප්‍රජා ශාලාව |

**සිදු වූයේ කුමක් ද?** ප්‍රජා ශාලාව සවස් කාලයේ පිරිමින් විසින් කාඩ් ගැසීම සඳහා භාවිතා කිරීම.

**පුරුෂ සභිකයන් බහුතරයකින් සමන්විත වන ග්‍රාම සංවර්ධන මණ්ඩල වලදී ප්‍රමුඛතාවයන් තීන්දු වන්නේ මේ අයුරින් නොවන්නේ ද? සාකච්ඡාවට ලක් කරන්න.**

## සටහන

## සටහන

## සාකච්ඡා සටහන 8

### මහජන මුදල් වැය කිරීම හා බලපෑම විග්‍රහ කිරීම

අප විසින් ඇසිය යුතු ප්‍රශ්න

අ) කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට සාපේක්ෂව පිරිමින්ට හා පිරිමි දරුවන්ට මහජන වියදම් සත්‍ය වශයෙන්ම බෙදී යන්නේ කෙසේ ද?

ආ) රජයේ වියහියදම් ස්ත්‍රී සංවේදීව වියදම් වෙනවා ද?

ඇ) යම් සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය මුදල, එනම්, වසරකට එක දරුවෙක් වෙනුවෙන් වැය වන මුදල අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව විමසිය හැකිය.

උදා.:
- එක් අවුරුද්දක් තුළ ප්‍රාථමික පාසලක් පවත්වාගෙන යාම සඳහා කොපමණ මුදලක් අවශ්‍ය වේද යන්න විමසීම කළ හැකිය.
- ප්‍රාථමික පාසලක අධ්‍යාපනය ලබන ගැහැණු දරුවන් හා පිරිමි දරුවන් සංඛ්‍යාව සොයා බැලීම.
- ගැහැණු දරුවන්ට සාපේක්ෂව පිරිමි දරුවන්ට කොපමණ මුදලක් වාර්ෂිකව වැය කරනවාද යන්න සොයා බැලීමට මෙම සංඛ්‍යා ලේඛන අපට උපකාරී විය හැකිය.

## සටහන

## සටහන

## සාකච්ඡා සටහන 9

### මුදල් උපයා ගැනීම සහ බලපෑම් විග්‍රහ කිරීම

අ) රජය වියදමට මුදල් ලබා ගන්නේ කෙසේ ද?

- ප්‍රධාන වශයෙන්ම ආදායම් බදු පැනවීම හරහා ය.
- ආදායම් බදු/විවිධ බදු වශයෙන් ද ලැබෙන මුදල කොපමණ ද?
- පළාත් පාලන ආයතන මුදල් එක් රැස් කර ගන්නා ක්‍රම මොනවා ද?
  උදා.: කඩ බදු දීම, රථ වාහන බදු

ආ) බදු වලින් ලබා ගන්නා ආදායම වියදම් කර ඇත්තේ අය වැය ලේඛනයේ සඳහන් කුමන විෂයයන් වෙනුවෙන් ද? (සාකච්ඡා කරන්න.)

ඇ) මෙම වැය කිරීම් හේතු කොට රටේ හෝ ප්‍රදේශයේ ස්ත්‍රී පුරුෂ අසමානතාව දුරලීමට හැකි වී තිබේ ද?
උදා.: මෙම දිස්ත්‍රික්කයේ ගර්භණී මවුවරු වෙන්වෙන් පෝෂණ වැඩපිළිවෙළක් දියත් කර තිබේ ද?

ඈ) කාන්තාවන් වෙනුවෙන් ස්වයං රැකියා ව්‍යාපෘතියක් දියත් කිරීමට ප්‍රමාණයක් මුදලක් බදු හරහා ප්‍රාදේශීය සභාවලට ලැබේ ද?

## සටහන

# සටහන

## සාකච්ඡා සටහන 10

### රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ස්ත්‍රීන් හා පුරුෂයන් කෙරෙහි ඇති කරන බලපෑම දෛනික ජීවිතය මත පදනම්ව සොයා බැලීම

1) මූල්‍ය ප්‍රතිපත්තිය - පෞද්ගලීකරණය

උදා.: රජයේ රෝහල් නේවාසිකව ප්‍රතිකාර ගැනීම සම්බන්ධයෙන් පෙර අත්දැකීම් සහ වර්තමානයේ පෞද්ගලික රෝහලක නේවාසිකව ප්‍රතිකාර ගැනීම.

මෙහිදී ගෙදර කාන්තාවන්ට ඉසිලීමට ඇති බර වැඩි වී තිබේ ද?

2) මූල්‍ය ප්‍රතිපත්තිය - අයවැය කප්පාදුව

උදා.: අයවැය තුළ වියදම් කපා හැරීමෙන් බලාපොරොත්තු වන්නේ මුදල් ඉතිරි කර ගැනීමයි. ඉන් කොපමණ බරක් කාන්තාවන්ට පැටවෙනවා ද?

සාකච්ඡාව: මේ අනුව වියදම් කපා හැරීමේ යෝජනා ගෙනෙන කවර අවස්ථාවකදී වුවද ඇසිය ප්‍රශ්නය වන්නේ එම සේවාවන් වලින් වැඩිම ප්‍රයෝජනයක් ලැබුණේ කාටද යන්නයි. මේ අනුව අපට ඉන් ස්ත්‍රීන්ගේ ජීවිත කෙරෙහි ඇති කර වන බලපෑම විග්‍රහ කළ හැකිය.

# සටහන

# සටහන

## සාකච්ඡා සටහන 11

**බදු ප්‍රතිපත්තිය සකස් කිරීමේදී වැඩි බර පැටවෙන්නේ කාට ද?**

- වක්‍ර බදු, වැට් බදු, ඍජු බදු
  උදා.: ඖෂධ මිල ඉහල යෑම

- සුරා බදු
  මේ නිසා ගෘහණියන්ගේ පඩි පතට ඉන් ඇති කරන බලපෑම සොයා බැලීම.

- විවිධ බදු
  පවුල් ඒකකයට බලපාන අන්දම සොයා බැලීම

බදු ප්‍රතිපත්තිය ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට වෙනස්ව බලපාන අන්දම තේරුම් ගැනීම මෙම සාකච්ඡාවේ අරමුණයි. ඒ අනුව බදු ප්‍රතිපත්ති සකස් කිරීමේදී සමානාත්මතාවය සුරකින අයුරින් කටයුතු කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළ හැක.

### සටහන

# සටහන

# සටහන

## සාකච්ඡා සටහන 12

### ස්ත්‍රීන්ගේ දායකත්වයට මිලක් තිබේ ද?

1) කාන්තාවන් විසින් වැටුප් රහිතව කොතරම් වැඩ ප්‍රමාණයක් කරනවා ද? එය ගණනය කිරීම අසීරුය. (දරුවන් හදා වඩා ගැනීම, වැඩිහිටියන් හා රෝගී අය බලා කියා ගැනීම, කෑම පිසීම, ගේදොර පිරිසිදු කිරීම, රෙදි සේදීම, මැදීම)

2) ලෝකයේ වැඩ ප්‍රමාණයෙන් 1/3ක්ම කාන්තාවන් විසින් වැටුප් නොලබා සිදු කරයි.

3) බිරිඳ විසින් නිවසේ කරන වැඩ ප්‍රමාණය වෙනත් කෙනෙකු ලවා මුදලට සිදු කළහොත් පිරිමින්ට එම කාර්යයට මුදල් ගෙවීමට හැකියාවක් තිබේ ද? (කාන්තාවන් කරන වැඩ ප්‍රමාණයට යම් කිසි මුදලක් නියම කළහොත් මේ බව පෙනී යනු ඇත.)

4) ශ්‍රම වෙළඳපොළ තුළ ස්ත්‍රී පුරුෂ අසමානතාවය ක්‍රියාත්මක වන අයුරු සැලකිල්ලට ගන්න. කාන්තාවන්ගේ ශ්‍රමයේ වටිනාකම නව ශ්‍රම වෙළඳපොළ තුළ තීන්දු වී ඇත්තේ මෙම අසාධාරණ තත්ත්වයන් ඉස්මතු කරමින් බව අපට වටහා ගත හැක. මෙම තත්ත්වය සාකච්ඡා කරන්න.

# සටහන

## සටහන

## සාකච්ඡා සටහන 13

.........................................................

.........................................................

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විග්‍රහය යොදා ගනිමින් අයවැයකරණ සාකච්ඡාව සඳහා පහත සන්දර්භය කෙරේ අවධානය යොමු කරන්න.

- මැද පෙරදිග
- නිදහස් වෙළඳ කලාපය
- වතුකරය
  1) මෙම ස්ත්‍රීන් ආර්ථිකයට ලබා දෙන මුදල කොපමණ ද?
  2) එම මුදල අයවැය ලේඛනය තුළ සටහන් වන්නේ කොතැන ද?
  3) කුමන විෂයයන් සඳහා මෙම ආදායම (සුබසාධනය සහ ආරක්ෂාව) වෙන් වන්නේ ද සොයා බලන්න.

### සමීක්ෂණයකට ආධාර

1) ශ්‍රී ලංකාවේ අයවැය ලේඛනයේ වනිතා කටයුතු අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුදල කොපමණ ද?
2) එම මුදල ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම්, අභිවෘද්ධිය හා සුබසාධනය සඳහා ප්‍රමාණවත් යැයි ඔබ කල්පනා කරන්නේද?

# සටහන

# සටහන

## සාකච්ඡා සටහන 14

.......................................................

.......................................................

- සෑම වසරේම අයවැය විවාදයට පෙර වනිතා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අධ්‍යයනය කරන්න.
- වනිත් කටයුතු අමාත්‍යාංශය පිහිට වූ දින සිට අද වන තෙක් සමස්ත අයවැයෙන් එම අමාත්‍යාංශයට වෙන් වන්නේ කොපමණ ප්‍රතිශතයක් ද?
- හැන්සාර්ඩ් වාර්තාවල විවාදය වලදී ඉදිරිපත් වී ඇති අදහස් කියවීමට සුදුසුයි.
- සමෘද්ධි අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ද මේ අයුරින්ම විග්‍රහ කරන්න.

### සටහන

## සටහන

## සටහන

## සාකච්ඡා සටහන 15

### අයවැයකරණය සහ යහ පාලනය අතර ඇති සම්බන්ධතාවය තේරුම් ගැනීම

- **මනා ආණ්ඩුකරණය (Good Governance)**

  මනා ආණ්ඩුකරණය (යහපාලනය) සඳහා තිබිය යුතු සුවිශේෂී ගුණාංග මොනවා ද?

- **වගකීම (Accountability)**

  ආණ්ඩුවක් තමන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජනතාවට වගඋත්තර දීමට බැඳී සිටියි.

  මෙම වගකීම් මොනවා ද?

  - ජනතාවට ආහාර සැපයීම.
  - අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑම.

  ක්‍රියාකාරකම: මේ සම්බන්ධව ලැයිස්තුවක් සකස් කර ගැනීමට කණ්ඩායම් සාකච්ඡා යොදා ගත හැක.

- **කාර්යක්ෂමතාවය (Efficiency)**

  ආර්ථිකය හා මානව සංවර්ධනය ස්ත්‍රී පුරුෂ අසමානත්වය තුරන් කිරීමට යොමු විය යුතුය.

  අසමානතාවයන් ඇති සමාජයක් කාර්යක්ෂම නොවේ. ස්ත්‍රී පුරුෂ අසමානතාවය ඇති විට මානව සංවර්ධනය පසුබෑමකට ලක් කරන බව දත්තයන්ගෙන් පෙනී යන කරුණකි.

## සාකච්ඡා සටහන 15 - ඉතිරිය

- **විනිවිදභාවය නැතහොත් විවෘතභාවය (Transparency)**

  පාලකයන් ගන්නා තීන්දු ජනතාව ඉදිරියේ තැබිය යුතුය. සියලු තීන්දු පුළුල් සංවාදයකට ලක් විය යුතුය. අයවැය සකස් කිරීම, බදු, ප්‍රතිපත්ති පැනවීම ජන ජීවිතයට විවිධ බලපෑම් ඇති කරයි. ජන සහභාගී පාලන තන්ත්‍රයක් නිර්මාණය කිරීම අද කාලීන අවශ්‍යතාවයකි. විනිවිදභාවය යනු ජනතා සහභාගීත්වය වර්ධනය කිරීමයි. සංවර්ධන කටයුතු තීරණය කිරීමට ජනතාවට අවකාශයක් ලබා දීමය.

- **සමානාත්මතාවය (Equality)**
  - සමාජයේ ඇති නැති පරතරය තුරන් කිරීම යහපත් පාලනයක ප්‍රධාන වගකීමයි.
  - සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ අසමානතාවයන් තුරන් කර ලීමද මනා පාලනයේ ප්‍රධාන අභියෝගයක් වන්නේ ය.

## සටහන

# සටහන

## සටහන



**අප ගොඩනගන අයවැය විමර්ශන ක්‍රියාවලිය හරහා අයවැයකරණය ජනතා සංවේදී සරල ක්‍රියාවලියක් බවට පත්වන්නේය.**

**සම්පත් සාධාරණ ලෙස බෙදී යෑමක් සිදු වන්නේ නම් දිළිඳුකම, මන්දපෝෂණය ඇති වන්නේ නැත.**

**රාජා භවතු ධම්මිකෝ...!**

# CONCLUSION AND POLICY SUGGESTIONS IN RELATION TO GENDER BUDGET EXERCISE IN INDIA

It is possible to measure the incidence of the benefits of public expenditure among different sections of the community grouped by gender, income, class or any other criteria for services and transfers which go to individuals. However, many government expenditures are meant to provide services that are essentially public in nature – for instance, expenditures on defence, maintenance of law and order and dispensation of justice – their consumption being 'non-rival”, it is not possible to use benefit incidence analysis to measure the distribution of this expenditure. It is possible to conduct gender analysis of the provision of non-rival goods by looking at how far they meet the different needs of males and females. The fact that goods are 'non-vital' in consumption does not mean that their benefits are equally distributed. However, such analysis is beyond the scope of the study.

Considering the gender bias inherent in a male dominated society like India– and the evidence from the trends in sex ratio shows how the bias is getting accentuated – it is time the government budgets provided a clear indication of how much is earmarked specifically for the benefit of women. The suggestion is not to provide gender-wise break-up of all government expenditures, but that the expenditures meant primarily for women be shown separately so that they can be easily culled out from budget heads of social and economic services in which it is possible to segregate such expenditures. With this objective in view, this presents a gender diagnosis in India in access to resources and in economic activity and categorises expenditures in terms of gender allocations in the Union budgets 2001-02 and 2002-03 and then recommends the following priority actions for gender-sensitive budgeting.

Collating gender-disaggregated data and conducting gender auditing

A system should be set up to collate gender-disaggregated data from relevant departments to obtain the gender-wise relevant statistical database, targets and indicators. A gender audit of plans, policies and programmes of various ministries with pro-women allocations should be conducted for evaluations of the progress.

## Segregation of provision for women

Segregate the provisions for women in the composite programmes under education, health and rural development sectors, which target girls/women as the principal beneficiaries. This segregation is important in order to protect the provisions by placing restrictions on their re-appropriation for other purposes. It is necessary to ensure that the funds so earmarked are spent on intended purposes. It the expectations set forth in the Budget are achieved, even partially, the end results are bound to be positive. The absence of such identification in the provisions and the related targets, on the contrary, greatly vitiates the implementation of the programmes. Segregation of the provisions for the benefit of women and their implementation would significantly contribute to the ultimate empowerment of women.

## Consolidation of Programmes

It is doubtful that given the size of the country, its population and the magnitude of the problems, schemes with small provisions have much practical significance in the overall context, except perhaps for demonstrative or experimental reasons. Such schemes (with provision of Rs. 100 million or

less) should be reviewed, merged or consolidated, in order to secure a meaningful impact.

## Monitoring Output

The implementation of many of the schemes leaves a lot of scope for improvement. Many schemes fall to take off, even after necessary provisions are made due to procedural delay in their finalization and getting the appropriate approvals (like that of Expenditure Finance Committee, etc.). The provisions are reduced during the course of the year (say, in the revised estimates), and the final expenditure is still less. In many cases, particularly those coming under the social sector, government budgetary support is provided by way of grants-in-aid to the implementation agencies. The grantees sometimes have their own priorities and instead of utilizing the funds received for earmarked purposes, spend them elsewhere. It is necessary to tighten the system and closely monitor implementation of each scheme, to secure a result-oriented direction all round. Focusing on how much money has been allocated for schemes benefitting women can be counter-productive it the outcome of schemes depart substantially from the objectives tha they were designed to serve.





# GENDER BUDGETING

Women's Political Academy Project

Supported by:

EUROPEAN UNION

IMADR